මගේ අංකය - JSC/SPO/Regi.Recruit/ Limited/2026

සියළුම විභාග අපේක්ෂකයින් වෙත,

උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ ශ්‍රී ලංකා අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගයේ සම්මුඛ පරීක්ෂණයට කැඳවීම සඳහා කඩඉම් ලකුණු නිකුත් කිරීම - 2026

උක්ත සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ කඩඉම් ලකුණු මට්ටම 179 ක් (සෑම විෂයයකටම ලකුණු 40 ක් හෝ ඊට වැඩියෙන් ලබාගත්) ලෙස අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් තීරණය කර ඇත.

02. ලකුණු 179 ක් හෝ ඊට ඉහළ ලකුණු ලබා ගෙන ඇති අයදුම්කරුවන් (ප්‍රතිඵල ලේඛනයේ අනු අංක 01 සිට 91 දක්වා) 2026.11.14 දින පෙ.ව.09.00 ට අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

03. ඒ සඳහා සහභාගීවීමට සුදුසුකම් ලත් අයදුම්කරුවන් පහත දැක්වෙන ලේඛනවල මුල් පිටපත් සමඟ ඒවායේ සහතික කර ගන්නා ලද ඡායාස්ථික පිටපත් පහත සඳහන් අනුපිළිවෙලට සකස්කර රැගෙන ආ යුතුය.

i. උප්පැන්න සහතිකය
ii. ජාතික හැඳුනුම්පත
iii. අධ්‍යාපන සහතික හා වෙනත් සහතික
iv. මුල් පත්වීමේ දින සිට දැනට දරණ තනතුර දක්වා පත්වීම් ලිපි සහ එම තනතුරු වල සේවය ස්ථිර කිරීමේ ලිපි (අනියම් පත්වීම් හැර)
v. කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත් බවට සහතික
vi. මුල් පත්වීමේ දින සිට දැනට දරණ තනතුර දක්වා උපයා ගෙන ඇති වැටුප් වර්ධක සම්බන්ධ විස්තර
vii. සේවා සහතිකය (සක්‍රීය හා සතුටු දායක සේවා කාලය ඇතුලත්)
viii. සංවර්ධන නිලධාරී සේවයට අයත් (වැඩ සටහන් සහකාර, ගිණුම් සහකාර ඇතුළුව) තනතුරක නිලධරයෙකු නම් අයදුම්පත් කැඳවන අවස්ථාවේ දී අධිකරණවලම අඛණ්ඩ වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අධිකරණයකම භෞතිකව සේවයේ යෙදී සිටින සේවය ස්ථිර කර ඇති නිලධාරියෙකු බව සහතික කල යුතුය

04. මේ සම්බන්ධයෙන් ගමන් වියදම් ගෙවනු නොලැබේ.

05. මෙම දැන්වීම මෙම සම්මුඛ පරීක්ෂණය සඳහා කරන කැඳවීම් ලිපිය වන අතර, වෙනත් කැඳවීමේ ලිපියක් නිකුත් කරනු නොලැබේ.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

ප්‍රසන්න අල්විස්
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

ප්‍රසන්න අල්විස්
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2026 නොවැම්බර් මස 05 දින
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදිය.